# වාර්ෂික වාර්තාව - 2016
# ஆண்டறிக்கை - 2016
# Annual Report - 2016

## හෝමියෝපති වෛද්‍ය සභාව
## ஹோமியோபதி மருத்துவ சபை
## Homoeopathic Medical Council

අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර.
දුරකථන අංක : 011-2958175 ෆැක්ස්: 011-2958175
e mail : homosri.mcouncil@gmail.com

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
Ministry of Health, Nutrition & Indigenous Medicine

Homoeopathic Medical Council
Samuel Hahnemann
Sri Lanka

# වාර්ෂික වාර්තාව

# 2016

## හෝමියෝපති වෛද්‍ය සභාව

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය

අමාත්‍යාංශය

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| 01. | සාරාංශය | 02 |
| 02. | හැඳින්වීම | 04 |
| 03. | හෝමියෝපති වෛද්‍ය සභාව | 05 |
| 04. | පසුබිම් විස්තරය | 06 |
| 05. | වෛද්‍ය සභාවේ අරමුණු | 08 |
| 06. | වෛද්‍ය සභාව සතු බලතල | 09 |
| 07. | වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය | 11 |
| 08. | සංස්ථාපිත තොරතුරු | 12 |
| 09. | වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම - 2016 | 13 |
| 10. | හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 15 |
| 11. | විගණන වාර්තාව | 23 |
| 12. | සුභාසිංශන | 24 |

# 01. සාරාංශය

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2016 වසරේ සමස්ත ක්‍රියාකාරීත්වය ඇතුළත් වාර්ෂික වාර්තාව මෙමඟින් ඉදිරිපත් කෙරේ. වෛද්‍ය සභාවේ දැක්ම හා අරමුණු වලට අදාළව එහි ක්‍රියාකාරිත්වය වාර්ෂිකව ඇගයීමට අවශ්‍ය පදනම සැකසීම මෙලෙස වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ අපේක්ෂාව වේ.

2016 වසරේ මුල් භාගයේදී පෙර වසරේ මෙන්ම හෝමියෝපති වෛද්‍ය සභාව මෙහෙයවනු ලැබුවේ හෝමියෝපති අතුරු පාලක කමිටුවක් විසිනි. එහෙත් 2016 වසර අවසන් වූයේ හෝමියෝපති වෛද්‍ය සභාව සිය ඉතිහාසයේ තීරණාත්මක මංසන්ධියක් කරා පමුණුවමිනි. එනම් වෛද්‍ය සභාවේ ව්‍යුහය පුළුල් හා බලපෑම් සහගත වෙනසකට ලක් කරමිනි. වෛද්‍ය සභාව සම්බන්ධයෙන් මෙතෙක් බල පැවති 1970 අංක 07 දරණ හෝමියෝපති පනත වෙනුවට 2016 අගෝස්තු 22 වන දින සිට බලාත්මක කෙරුණු 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත මඟින්, එතෙක් හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් පමණක් සමන්විත වූ වෛද්‍ය සභාවේ සංයුතිය සෞඛ්‍ය, අධ්‍යාපන හා මුදල් යන අමාත්‍යාංශවලට අයත් ස්ථිර රාජ්‍ය සේවයේ උසස් නිලධාරීන් ද ඇතුළත් වන පරිදි ප්‍රතිව්‍යුහකරණයකට ලක් කරන ලදී. සිය අරමුණු සාධනයෙහි ලා ගනු ලබන සෑම ක්‍රියාමාර්ගයකදීම ස්ථිර රාජ්‍ය සේවයේ මගපෙන්වීම හා සහාය නිරන්තරයෙන් ලැබෙන පදනමක් මත වෛද්‍ය සභාව පිහිටුවීමට මේ අනුව නව පනත මඟින් කටයුතු කර ඇත.

වෛද්‍ය සභාව මගින් මෙහෙයවනු ලබන, දිස්ත්‍රික් 07ක ස්ථාපිත කර ඇති රජයේ හෝමියෝපති සායන 7 දියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනයට අවශ්‍ය පියවර ගැනීමට අමතරව නව සායන 7ක් ආරම්භ කිරීමට නොවැම්බර් මාසයේදී රැස් වූ නව හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව ප්‍රථම රැස්වීමේදීම තීරණය කළේය. එමෙන්ම මෙම රැස්වීමේදීම හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරු 7 දෙනෙකු ලියාපදිංචි කිරීම, සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් ලබාදීම, පනතේ 30 (1 ) වගන්තිය ප්‍රකාරව වසර 05 කට වැඩි කාලයක් වෛද්‍ය වෘත්තියේ යෙදුණු වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා වන විභාගය පැවැත්වීමට අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම යනාදී වශයෙන් වන ඉතාම වැදගත් තීරණ ගණනාවකට එළැඹුණි.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමෙහි ලා අවශ්‍ය මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සිය දැක්ම කරගත් හෝමියෝපති වෛද්‍ය සභාවේත් හෝමියෝපති සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් හඳුන්වාදීමේ සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේත් අරමුණු සාධනය කිරීම වෙනුවෙන් 2016 වසරේ සිදුවූ මෙහෙවර මැන බැලීම සඳහා වැදගත් අවස්ථාවක් මෙම වාර්තාව එළිදැක්වීම මඟින් උදාවනු ඇත.

# 02. හැඳින්වීම

“ සමාන දෙයින් සමාන දෙය නැසීම ” යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැකිය. 18 වන සියවසේ දී මෙම වෛද්‍ය ක්‍රමය ලොවට හඳුන්වා දෙනු ලැබුවේ බටහිර වෛද්‍ය ක්‍රමයේ විශේෂඥයෙකු වූ ජර්මන් ජාතික ක්‍රිස්ටියන් ෆෙඩ්රික් හානිමාන් විසිනි. අද වනවිට විද්‍යාත්මකව හා තාක්ෂණිකව වර්ධනය වෙමින් පවතින හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාව තුල ප්‍රබල ස්ථානයකට පත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. ඒ අනුව ඉන්දියානු රජය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, රටපුරා විහිදුණු හෝමියෝපති රෝහල් පද්ධතියක් මඟින් එරට මහජන සෞඛ්‍ය සේවා සැපයීමට පමණක් සීමා නොවී, හෝමියෝපති වෛද්‍ය උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යාල, හෝමියෝපති ඖෂධ නිෂ්පාදන කරන කර්මාන්ත ශාලා සහ හෝමියෝපති පර්යේෂණ ආයතන බිහිකර තිබීම මගින් මෙම කරුණ මොනවට පැහැදිලි කෙරේ.

1970 අංක 07 දරණ හෝමියෝපති පනත මගින් මුලින්ම ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කළ අතර එය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ සහ වර්ධනය කිරීමේ භාරධූර කාර්යයට උර දී ඇත. එහෙත් එහිදී පැන නැඟි නීතිමය හා ව්‍යුහාත්මක බාධාවන් ඉදිරියේ අවසාන වශයෙන් වෛද්‍ය සභාව බිඳ වැටුණි. කෙසේ වෙතත් මෙම අභියෝගයන් ජය ගැනීමේ අරමුණ ද සහිතව 2016 අංක 10 දරණ හෝමියෝපති පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණි. මෙම නව පනතේ I කොටසේ 2 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාව යළි පිහිටුවීම සඳහා වන කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස, පනතේ 51 වගන්තිය අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ මුල් ස්වරූපය ලෙස හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් 2016 වසරේ දී ස්ථාපිත කරන ලදී. ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව හෝමියෝපති වෛද්‍යවරුන් 04 දෙනෙකුගෙන් සහ රාජ්‍ය නිලධාරීන් 6 දෙනෙකුගෙන් සමන්විත වේ. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී මෙම සභාවේ ලේකම්වරයා වේ.

හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු සාධනයෙහි ලා එහි කාර්යභාරය යටතට ගැනෙන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 07 ක රජයේ හෝමියෝපති සායන 07 ක් ස්ථාපිත කර ඇත. දෙහිවල, පරකඩුව, මොණරාගල, පාලමුනෙ, මාතලේ, කුරුණෑගල, හා තෝලංගමුව එම ස්ථාන වේ.

# 03. හෝමියෝපති වෛද්‍ය සභාව

## දැක්ම

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම”

## මෙහෙවර

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරහයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නඟා සිටුවීම හා අභිවර්ධනය කිරීම.”

## පරමාර්ථ

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධි විධාන වලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

# 04. පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ව්‍යවස්ථාපිත ආයතනයකි. ප්‍රථම වෛද්‍ය සභාව **හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව** ලෙස 2016 අංක 10 දරණ හෝමියෝපති පනත මගින් නම් කෙරෙන අතර එහි සාමාජිකයන් පත් කිරීමේ බලය ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් නිල බලයෙන් පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ඡන්දයෙන් තෝරා ගැනෙන සාමාජිකයන් පස් දෙනෙකු, හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු අනිවාර්යයෙන් ඇතුළත් වන සේ ගරු අමාත්‍යතුමා විසින් පත් කෙරෙන තිදෙනෙකු ඇතුළත් 11 දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයකින් සමන්විත වේ. පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග සෑදීමේ බලය ගරු අමාත්‍යතුමා සතු වන අතර නියම කර ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පනතට අනුකූලව රීති සම්පාදනය කිරීමේ බලය සභාව වෙත පවරනු ලැබ ඇත.

## නීති සහ රෙගුලාසි

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේදී බලාත්මකව පැවති සෑම නියෝගයක්ම, මෙම පනත යටතේ නියෝග සාදන තෙක්, මෙම පනත ප්‍රකාරව සාදන ලද නියෝග ලෙස පනතට අනුකූලව සැලකේ. නව පනත යටතේ අවශ්‍ය නියෝග සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින හෙයින් 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ බලාත්මකව පැවති නියෝග මේ අනුව තවදුරටත් වලංගුව පවතී.

## <u>1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව ප්‍රකාශයට පත් කර ඇති නියෝග</u>

1. හෝමියෝපති රෙගුලාසි - 1980

(වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)

2. හෝමියෝපති වෛද්‍ය සභාවේ නීති - 1981

3. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

## හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම

මෙරට මුලින්ම හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්කර ඇත්තේ, 1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුකූලව, 1979 වසරේ දී විෂය භාර ගරු ඇමතිතුමා විසිනි. වසර 5 කට වරක් වෛද්‍ය වෘත්තිකයන්ගේ ඡන්දයෙන් වෛද්‍ය සභාව පත් කර ගත යුතු ( පළමු වෛද්‍ය සභාව හැර ) වුවද අඛණ්ඩව වෛද්‍ය සභාව පත් කර ගනු ලැබීමක් සිදුව නොමැත. 1979 ට පසුව දෙවැනි වෛද්‍ය සභාව 1998 දීත් තෙවැන්න 2006 දීත් වශයෙන් පත්ව ඇති අතර තුන්වෙනුව පත් කෙරුණ වෛද්‍ය සභාව 2009 දී නිල කාලය නිමවීමට පෙර විෂයභාර ඇමතිතුමා විසින් විසුරුවා හැර ඉතිරි වසර දෙක සඳහා නව වෛද්‍ය සභාවක් පත් කරන ලදී.

එහි නිල කාලය 2011 ජනවාරි 30 දිනෙන් අවසන් විය. ඒ වන විට බල පැවති හෝමියෝපති පනතේ දූර්වලතා මගහැර නව පනතක් ගෙන එන තෙක් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත ගරු ඇමතිතුමා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් හෝමියෝපති අතුරු පාලක කමිටු පත් කෙරුණි. 2011 ජුනි 16 වැනි දින සිට 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත හඳුන්වා දුන් 2016 ජුලි 29 තෙක්ම හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ අතුරු පාලක කමිටුවක් මඟිනි. මෙසේ පත් කෙරුණු අතුරු පාලක කමිටු සංඛ්‍යාව 05කි. මෙම කාල වකවානුව පුරාම හෝමියෝපති වෛද්‍යවරුන්ගේ තාක්ෂණික කමිටුවක සහාය හෝමියෝපති අතුරු පාලක කමිටුවට ලැබුණි.

## හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත සම්මත වීමෙන් පසුව 2016 ඔක්තෝබර් මස 21 දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමා විසින් පනත මඟින් ඔහු වෙත ලබා දී ඇති බලතල වලට අනුකූලව හෝමියෝපති අතුරු පාලක සභාවක් පත් කරන ලදී. පනතට අනුව මුලින්ම පත් කෙරෙනුයේ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවය. එහි නිල කාලය වසර දෙකකි. පනත බලාත්මක කිරීමට අත්‍යාවශ්‍ය වන නියෝග සම්පාදනයට අදාළ මූලික කෙටුම්පත් සකසා සම්මත කරවා ගැනීම මෙම සභාවේ ප්‍රමුඛ කාර්ය ලෙස සැලකේ.

# 05. වෛද්‍ය සභාවේ අරමුණු

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු පහත සඳහන් පරිදි

01. හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම සහ නියාමනය කිරීම;

02. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව සමාජය තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම;

03. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම, ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම;

04. හෝමියෝපති ආයතනයන් පිහිටුවා පවත්වා ගෙන යාම;

05. රජයේ හෝමියෝපති රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සහ පාලනය කිරීම;

06. හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ වෙනත් පිළියෙල කිරීම්, නිෂ්පාදන, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදා හැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම.

# 06. වෛද්‍ය සභාවේ බලතල

පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් බලතල හෝමියෝපති වෛද්‍ය සභාව සතුවේ.

01. හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන්, සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම;

02. හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම;

03. හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් වෙත සුදුසුකම් ප්‍රදානය කළ ආයතන වෙතින් ඒ පිළිබඳ සහතික කරවා ගැනීම;

04. හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන නියාමනය කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම;

05. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව ප්‍රතිකාර සේවා සැපයීම;

06. හෝමියෝපති ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ පශ්චාත් අධ්‍යයන පාඨමාලා සකස් කිරීම;

07. හෝමියෝපති ඖෂධ ආනයනය හෝ අපනයනය;

08. හෝමියෝපති ඖෂධ විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීම හා දිරිමත් කිරීම;

09. හෝමියෝපති වෛද්‍ය පහසුකම්, උපකරණ, පාඨමාලා හා විභාග සම්බන්ධ අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම;

10. හෝමියෝපති විෂය හදාරන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම, හෝමියෝපති පර්යේෂණ ආයතන දිරිමත් කිරීම, අවශ්‍ය ආයතන සහ පුද්ගලයින් සඳහා මූල්‍යාධාර හෝ වෙනත් සහන ලබාදීම;

11. පශ්චාත් උපාධි හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෛද්‍ය අධ්‍යාපන අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම;

12. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව මහජන සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම;

13. වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ උපාධි හා අනෙකුත් අධ්‍යාපන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතන සමඟ කටයුතු කිරීම;

14. 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම;

15. සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල හා කමිටු අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පිහිටුවීම;

16. නිලධරයෙකු හෝ කමිටුවක් වෙත යම් බලතල හෝ කාර්යයන් පැවරීම;

17. සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරිම සහ ඉටු කිරීම සඳහා රීති සෑදීම;

18. පනත යටතේ බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම;

## 07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය හා ධූර කාලය

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව සභාපති ද ඇතුළුව 11 කි. නිල බලයෙන් පත් වන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු, භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු, සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ගෙන් සමන්විත රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතරින් ඡන්දයෙන් තෝරා ගැනෙන පස් දෙනෙකු සහ හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු ද අනිවාර්යෙන් ඇතුලත් වන පරිදි ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබන තිදෙනෙකු සහිතව සාමාජිකයන් 11 දෙනා පත් කෙරේ. වෛද්‍ය සභාවේ ලේකම් / ලේඛකාධිකාරී ගරු ඇමතිතුමාගේ අනුමැතිය මත පත් කරනු ලබන්නේ සභාව විසිනි. සභාව වසර තුනක් සඳහා පත් කෙරෙන අතර ලේඛකාධිකාරී වසර 5ක් සඳහා පත් කෙරේ.

## 08. සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| ආයතනයේ නම | :- | හෝමියෝපති වෛද්‍ය සභාව |
| ලිපිනය | :- | අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,<br>වැලිසර,<br>රාගම. |
| දුරකථන අංකය | :- | 011-2958175 |
| ෆැක්ස් | :- | 011-2958175 |
| විද්‍යුත් තැපැල | :- | homosri.mcouncil@gmail. Com |
| සංස්ථාපිත ආයතනයේ තත්ත්වය | :- | 2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 15,16 හා 17 වගන්ති ප්‍රකාර අරමුණු හා බලතල මත හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත |
| පරිපාලන ව්‍යුහය | :- | ලේකම් / ලේඛකාධිකාරී<br>කාර්යභාර වෛද්‍යවරු<br>කළමනාකරණ සහකාර<br>ඖෂධ සංයෝජක<br>කාර්යාල සහායක |
| බැංකුකරුවෝ | :- | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව, කොළඹ<br>කොමර්ෂල් බැංකුව - ජා ඇල ශාඛාව |

# 09. වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම - 2016

**<u>අරමුණ 01</u>**

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා නිසි පිළිගැනීමක් ලබාදීම.

<u>උපාය මාර්ග</u>

- ප්‍රතිකාර ලබා දීම තුළින් මහජන විශ්වාසය ගොඩනැගීම.
- වැඩිහිටියන් සහ ළමුන් තුළ වෛද්‍ය ක්‍රමය පිළිබඳ විශ්වාසය ගොඩනැගීම.
- අමාත්‍යාංශයේ සහ සියළුම ආයතන වල නිලධාරීන් දැනුවත් කිරීම.
- මාධ්‍ය මඟින් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ ප්‍රචාරයක් ලබා දීම.
- හෝමියෝපති වෛද්‍යවරුන් අතර සුහදත්වය වර්ධනය කිරීම.

**<u>අරමුණ 02</u>**

හෝමියෝපති සභාව සඳහා පිළිගත් නිශ්චිත පරිපාලන පටිපාටියක් හඳුන්වාදීම.

<u>උපාය මාර්ග</u>

- හෝමියෝපති වෛද්‍ය සභාවේ පරිපාලන ප්‍රතිපත්තිය පිළිබඳ රෙගුලාසි සම්පාදනය කිරීම.

**<u>අරමුණ 03</u>**

හෝමියෝපති මහජන සෞඛ්‍ය සේවාවක් ප්‍රතිස්ථාපනය කිරීම.

<u>උපාය මාර්ග</u>

- බඳවා ගැනීමේ ව්‍යුහයේ වෙනස්කම් අනුමත කර ගැනීම.
- වැටුප් සහ සේවක සංඛ්‍යාව.
- කොමිසමේ අනුමැතිය ලබා ගැනීම.

**<u>අරමුණ 04</u>**

හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් බිහිකිරීම හා පරිපූරක වෛද්‍යවරුන් බිහි කිරීම සහ ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

<u>උපාය මාර්ග</u>

- අතුරු නීති සම්පාදනය , පිළිගැනීම සහ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය පිහිටුවීම.

**<u>අරමුණ 05</u>**

හෝමියෝපති ඖෂධ හා නිෂ්පාදන පිළිබඳ වෙළඳ පොළ සුලභතාවය තහවුරු කිරීම.

<u>උපාය මාර්ග</u>

- අතුරු නීති සම්පාදනය.
- හෝමියෝපති බෙහෙත් ගබඩා සහ ඔසුසල් පිහිටුවීම සඳහා අරමුදල් ගොඩනැගීම.

# 10. හෝමියෝපති වෛද්‍ය සභාවේ ක්‍රියාකාරීත්වය
## - 2016 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා-

## 1. සායන කළමනාකරණය සහ පවත්වාගෙන යාම.

හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ දිස්ත්‍රික් 07 ක පිහිටුවා ඇති රජයේ හෝමියෝපති සායන 07 වෛද්‍ය සභාව මඟින් මෙම වසරේද සාර්ථකව පවත්වාගෙන යනු ලැබූ අතර මෙම සේවාව වර්ධනය කිරීම වෙනුවෙන් පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කරන ලදී.

- සායන පහසුකම් සහිත රජයේ ස්ථිර ගොඩනැඟිලි තුළ ස්ථාපිත කිරීමට පියවර ගැනීම. මේ යටතේ මොණරාගල රජයේ හෝමියෝපති සායනය ඉඩකඩ සහිත රජයේ ගොඩනැඟිල්ලක ස්ථාපිත කරන ලදී.
- වසර ගණනාවක් පුරා වෛද්‍යවරුන්ගේ ප්‍රබල ඉල්ලීමක්ව තිබූ රෝගීන්ට බෙහෙත් නිකුත් කිරීමට යොදා ගන්නා ප්ලාස්ටික් ඖෂධ බහාලුම් සහ කවර සායන වෙත ලබා දීම මෙම වසරේදී ආරම්භ කරන ලදී. මෙම තත්ත්වය ඖෂධ වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමටත්, හෝමියෝපති ප්‍රතිකාර දියුණු මට්ටමකින් පවත්වාගෙන යාමටත් හේතු වී ඇති බව සායන කරා ඇදී එන රෝගීන් සංඛ්‍යාව වර්ධනය වීමෙන් දැක ගන්නට ලැබුණි.

## 2. සායන වල කාර්ය සාධනය

වෛද්‍ය සභාව අධීක්ෂණය කරනු ලබන පහත සඳහන් සායන 7 තුළින් රෝගීන් **77,485** ක් වර්ෂය තුළ ප්‍රතිකාර ලබාගෙන ඇත.

| සායනයේ නම | සහභාගී වූ රෝගීන් ගණන |
|---|---|
| දෙහිවල | 16,401 |
| මොණරාගල | 4,489 |
| පාලමුනෙයි | 12,748 |
| මාතලේ | 8,158 |
| කුරුණෑගල | 10,757 |
| පරකඩුව | 13,054 |
| තෝලංගමුව | 11,878 |
| එකතුව | **77,485** |

## 3. හෝමියෝපති ජංගම සායන පැවැත්වීම.

වැලිසර රජයේ හෝමියෝපති රෝහල සමඟ එක්ව වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන වල සම්බන්ධීකරණයද සහිතව ජංගම හෝමියෝපති සායන 13 ක් මෙම වසර පුරා වෛද්‍ය සභාව විසින් පවත්වනු ලැබ ඇත. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් දක්වා ව්‍යාප්ත කිරීමේ අරමුණින් සංවිධානය කෙරුණු හෝමියෝපති ජංගම සායන හෝමාගම, මහරගම, උඩතුත්තිරිපිටිය, බොල්ලැගල, වරකාපොළ, රත්නපුර, මීගමුව, හලාවත, වැලිගල්ල, නීතිපති දෙපාර්තමේන්තු පරිශ්‍රය යන ස්ථාන වලදී පවත්වන ලද අතර ඒ සඳහා රෝගීන් 1,121 ක පිරිසක් සහභාගී විය.

## 4. මාධ්‍ය මඟින් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මහජනයා දැනුවත් කිරීම

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මහජනයා තුළ අවබෝධයක් ඇති කිරීම සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයට අයත් දෙහිවල හෝමියෝපති සායනයේ කාර්ය භාර වෛද්‍ය නිලධාරිනිය සහභාගී වී රූපවාහිනී වැඩසටහන් 12 ක් පවත්වන ලදී.

එමෙන්ම දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් පවත්වන ලද "පුරවර සැරිසර" සමාජ සත්කාර වැඩ සටහන සඳහා රෝගීන් 776 දෙනෙකු සහභාගි විය. තවද එම වෛද්‍යවරිය සහභාගී වීමෙන් කැළණිය විශ්ව විද්‍යාලීය පරිශ්‍රයේදී පවත්වන ලද ජංගම සායනය සඳහා රෝගීන් 160 දෙනෙකුද, ගම්පොළ වැලිගල්ල පැවැත්වූ ජංගම සායනය සඳහා රෝගීන් 100 දෙනෙකුද, ගල්කිස්ස උසස් බාලික විද්‍යාලයේ පැවැත්වූ ජංගම සායනය සඳහා රෝගීන් 150 දෙනෙකුද සහභාගි වූහ.

මෙම වැඩසටහන් වලින් පසුව රජයේ හෝමියෝපති සායන වල රෝගීන්ගේ සහභාගීත්වය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

## 5. හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

ඉන්දියාවේදී හෝමියෝපති වෛද්‍ය උපාධිය ලබා ගත් 07 දෙනෙකු හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කරන ලදී.

## 6. හෝමියෝපති වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය යාවත්කාලීන කිරීම.

2016 සඳහා වලංගු හා යාවත්කාලීන කළ හෝමියෝපති වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

## 7. හෝමියෝපති අතුරු පාලක කමිටුව

2016 වසරේ අගෝස්තු 22 වන දින 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත බලාත්මක වන තුරුම හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙය වනු ලැබුවේ පෙර වසර වලදී මෙන්ම අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත පත් කරනු ලැබ තිබූ හෝමියෝපති අතුරු පාලක කමිටුවක් විසිනි.

- **අතුරු පාලක කමිටුවේ වෙනස් වීම්.**

2015 වසර ආරම්භයේ සිට හෝමියෝපති අතුරු පාලක කමිටුවේ සභාපතිත්වය දැරූ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) ලෙස කටයුතු කල විජිතා සෙනෙවිරත්න මහත්මිය ස්ථාන මාරුවක් ලැබීම නිසා තනතුරින් ඉල්ලා අස්විය. 2016 මාර්තු 03 වන දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නව හෝමියෝපති අතුරු පාලක කමිටුවක් පත් කරනු ලැබීය. ඒ අනුව

- ගීතාමනී සී. කරුණාරත්න මිය, අතිරේක ලේකම් (සංවර්ධන) - සභාපති
  දේශීය වෛද්‍ය අංශය
- ඩබ්. ඒ. සී. එස්. ප්‍රියදර්ශනී මිය, ගණකාධිකාරී (ප්‍රධාන) - සාමාජික
  දේශීය වෛද්‍ය අංශය
- වෛද්‍ය ඒ.ජේ.එම්.මුනාවර් මයා - සාමාජික
  රජයේ හෝමියෝපති රෝහල

කෙසේ වෙතත් හෝමියෝපති අතුරු පාලක කමිටු රැස්වීම් මෙම වසර තුළ පැවැත්වූයේ 04 ක් පමණි.

| දිනය | කමිටු වාරය |
|---|---|
| 1. 2016.01.19 | 37 |
| 2. 2016.03.30 | 38 |
| 3. 2016.04.27 | 39 |
| 4. 2016.06.01 | 40 |

## 8. නව හෝමියෝපති පනත හා නව හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

පාර්ලිමේන්තුවේ සම්මත කෙරුණු 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත 2016 අගෝස්තු 22 වන දින සිට බලාත්මක කෙරුණු අතර පනතට අනුව ප්‍රථම වෛද්‍ය සභාව වන හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව ගරු ඇමතිතුමා විසින් 2016.10.21 වන දින සිට වසර 02 ක් සඳහා පත් කරන ලදී.

### අතුරු වෛද්‍ය සභාවේ සාමාජිකයන්

| | | | |
|---|---|---|---|
| 01 | වෛද්‍ය චන්දන වීරසේකර මහතා | - | සභාපති |
| 02 | වෛද්‍ය මොහොමඩ් මුනීර් මහතා | - | උප සභාපති |
| 03 | ගීතාමනී සී කරුණාරත්න මහත්මිය<br>(අතිරේක ලේකම්) සංවර්ධන, දේශීය වෛද්‍ය අංශය | - | සාමාජිකා |
| 04 | මහාචාර්ය හේමන්ත සේනානායක මහතා<br>විශ්ව විද්‍යාල කොමිෂන් සභාව | - | සාමාජිකා |
| 05 | ඩී.පී විමලසේන මහතා<br>ප්‍රධාන ගණකාධිකාරී, මුදල් අමාත්‍යාංශය | - | සාමාජිකා |
| 06 | වෛද්‍ය ජේ.එම්.ඩබ්.ජයසුන්දර බණ්ඩාර මහතා<br>නියෝජ්‍ය  අධ්‍යක්ෂක ජනරාල් ( දන්ත සේවා ) | - | සාමාජිකා |
| 07 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගුණපාල අමරසිංහ මහතා<br>දේශීය වෛද්‍ය ආයතනය, කොළඹ 08 | - | සාමාජිකා |

| | | | |
|---|---|---|---|
| 08 | හේරත් මහත්මිය<br>අමාත්‍යාංශ නීති නිලධාරී | - | සාමාජිකා |
| 09 | වෛද්‍ය චාන්දනී හේරත් මහත්මිය<br>කාර්යභාර වෛද්‍ය නිලධාරී (වැ.බ.) හෝමියෝපති රෝහල | - | සාමාජිකා |
| 10 | වෛද්‍ය අනුෂා ලෝකේෂ්වර මධුපාලි මහත්මිය | - | සාමාජිකා |

මේ අනුව නොවැම්බර් 04 දින රැස්වූ ප්‍රථම හෝමියෝපති වෛද්‍ය සභාව ඒ වන තෙක් නවතා තිබූ කරුණු ගණනාවක් ක්‍රියාත්මක කිරීම සඳහා නව හෝමියෝපති පනතට අනුව තීරණ ගන්නා ලදී.

1. පනතේ 30 (1) වගන්ති ප්‍රකාරව, වසර 05 කට වැඩි කාලයක් හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලෙස කටයුතු කළ අය හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා වන විභාගය පැවැත්වීම.

2. වෛද්‍ය සභාව විසින් ඖෂධ ආනයනය කර පහසු මිල ගණන් අනුව වෛද්‍යවරුන්ට ඖෂධ ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.

3. හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරු 07 දෙනෙකු ලියාපදිංචි කිරීම.

4. සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් ලබා දීම.

5. නව සායන 07 ක් ආරම්භ කිරීම සඳහා වෛද්‍ය නිලධාරී, ඖෂධ සංයෝජක හා කම්කරු යන තනතුරු සඳහා බඳවා ගැනීමට තීරණය කිරීම.
   යනාදී වශයෙන් වැදගත් තීන්දු ගණනාවකට පැමිණ ඒවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

## 9. වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීම

2016 ජනවාරි 01 වන දින හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ නව සායන 07 ක් ආරම්භ කිරීම සඳහා සහ පවත්නා සායන 07 සඳහා අමතර සේවකයන් ලබාදීමේ පදනමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නව තනතුරු 29 ක් අනුමත කරන ලදී. මේ අනුව

| | |
|---|---|
| වෛද්‍යවරු | 08 |
| ඖෂධ සංයෝජක | 07 |
| කම්කරු | 14 |

කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමට අනුමත කෙරුණි. මේ අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ අනුමත නව කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව 48 ක් දක්වා වර්ධනය විය.

## 10. කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම්.

පුරප්පාඩු වී තිබූ කළමනාකරණ සහකාර තනතුරට බඳවා ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබා ගත් ගොඩේවිතාන ලක්නිමා සමාධි මෙනෙවිය මෙම තනතුරට බඳවා ගනු ලැබීය. එහෙත් එසේ බඳවා ගැනුණු ඇය අප්‍රේල් මාසයේදී සේවයෙන් ඉවත් විය.

කළමනාකරණ සහකාර තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් දෙවන ස්ථානයට ලකුණු ලබා ගත් මල්ෂා ප්‍රතිභානි මෙම තනතුරට බඳවා ගැනීමට අතුරු පාලක කමිටුව තීරණය කරන ලදී. ඒ අනුව 2016.08.01 දින ඇය සේවයට බඳවා ගන්නා ලදී.

වෛද්‍ය සභාවේ නෛතික පදනම පිළිබඳ ගොඩනැගී තිබූ ව්‍යාකූලතාවයන් මත පදනම්ව වෛද්‍ය සභාවට විරුද්ධවූවන් කර තිබූ කරුණු දැක්වීම් නිසා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් නවත්වනු ලැබ තිබූ ඖෂධ සංයෝජකයන් සඳහා වූ NVQ පාඨමාලාව සැකසීම අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම මත යළි ආරම්භ කිරීමට හැකි විය.

## 11. නව සායන ආරම්භ කිරීම

නව සායන 07 ක් සඳහා තනතුරු අනුමත කර ගැනීමෙන් අනතුරුව තෝරා ගත් දිස්ත්‍රික්ක 07 ක සායන ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් රජයේ ගොඩනැඟිලි ලබා දෙන ලෙස දිස්ත්‍රික් ලේකම් වරුන්ගෙන් ඉල්ලා සිටීමටත් මෙම ඉල්ලීම අමාත්‍යාංශ ලේකම් මඟින් ඒ අය වෙත යැවීමටත් මුලදී අතුරු පාලක කමිටුවත් පසුව අතුරු වෛද්‍ය සභාවත් තීරණය කරන ලදී.

මෙම අවස්ථා දෙකේදීම යොමු කළ යුතු ඉල්ලීම සකස් කර අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

## 12. දත්ත හා කාලීන තොරතුරු

- 2015 දෙසැම්බර් 31 දක්වා ලියාපදිංචි වී ඇති හෝමියෝපති වෛද්‍යවරුන්ගේ **නාම ලේඛනය**

| කාණ්ඩය | 27-1-a | 27-1-b | 27-1-c | 27-2 | 27-5 | ලියාපදිංචිය තහවුරු කර ගත යුතු |
|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි වෛද්‍යවරු | 55 | 10 | 83 | 49 | 70 | 02 |
| උපාධිධාරී | 04 | - | - | - | - | - |
| ඩිප්ලෝමාධාරී | 51 | - | - | - | - | - |
| සාමාන්‍ය | - | 10 | 83 | 49 | 70 | - |

<u>සාරාංශය</u>

| | ලියාපදිංචිය ලත් වෛද්‍යවරු | විධිමත් ලෙස ලියාපදිංචි නොවූ | **2016** වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කළ | **2016** වසර සඳහා ලියාපදිංචිය යාවත් කාලීන නොකළ | මිය ගිය ගණන |
|---|---|---|---|---|---|
| මුළු ගණන | 267 | 02 | 149 | 72 | 46 |

## 13. බෙහෙත් ආනයනය

2016 ජනවාරි සිට දෙසැම්බර් 30 දක්වා ඖෂධ ආනයනය සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් 16 කට අනුමැතිය ලබා දී ඇත.

ඒවායේ මුළු වටිනාකම ඇ.ඩො. 45,556.39 කි.

## 14. ගොඩනැඟිලි අළුත් වැඩියාව

හෝමියෝපති වෛද්‍ය විද්‍යාල ගොඩනැඟිල්ල අළුත් වැඩියා කිරීමට අමාත්‍යාංශය විසින් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරන ලදී. වසර අවසාන වන විට පැවරූ කාර්යය 90% කට වඩා අවසන්ව තිබුණි.

# 11. විගණන වාර්තාව

නව හෝමියෝපති පනතක් හඳුන්වා දුන් 2016 වසර හෝමියෝපති වෛද්‍ය සභාව සිය ඉතිහාසයේ එක් තීරණාත්මක සංධිස්ථානයක් පසු කළ වසරක් ලෙස හැඳින්විය හැකිය. 2011 වසරේ පටන් අතුරු පාලක කමිටුවක් මඟින් කෙරුණු වෛද්‍ය සභාවේ මෙහෙයුම් නව පනතත් සමග යළිත් වෛද්‍ය සභාවක් වෙත මෙම වසරේ සිට පැවරුණි.

වෛද්‍ය සභාවට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා මෙහි ගිණුම් කටයුතු තවදුරටත් දේශීය වෛද්‍ය අංශය විසින් සිදු කරන ලදී. මෙම වසර සඳහා සකස් කෙරුණු අවසන් ගිණුම් ප්‍රකාශන මේ සමඟ ඉදිරිපත් කෙරේ.

අතුරු පාලක කමිටුව 4 වරක් සහ අතුරු වෛද්‍ය සභාව 2 වරක් පමණක් රැස් වූ මෙම වසරේ දී මාස්පතා වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවීමක් සිදු නොවුණ ද නව අතුරු වෛද්‍ය සභාව පත්වීමත් සමඟ වසර ගණනාවක් පුරා නැවතී තිබූ කාර්යයන් ගණනාවක් ක්‍රියාත්මක තලයට ගෙන ඒමට හැකිවිය. එමෙන්ම එම ගිණුම් ප්‍රකාශන හා වෛද්‍ය සභාවේ කාර්ය සාධනය පිළිබඳව විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව ද මෙම වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත් කර ඇත.

වෛද්‍ය චන්දන වීරසේකර  
සභාපති  
හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

# සුභාශිංසන

★ ★ ★ ★

ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය

ගරු නියෝජ්‍ය අමාත්‍ය

ලේකම් සහ අතිරේක ලේකම්

හෝමියෝපති වෛද්‍ය සභා සාමාජිකයන්/ සාමාජිකාවන්

නීතිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය

# 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

## අන්තර්ගතය


- **2016.12.31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට පාදක ( **1** සිට **5** දක්වා) සටහන්
- **2016.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට පාදක (**1** සිට **7** දක්වා) සටහන්
- **2016.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට පාදක ( **1** සිට **6** දක්වා) සටහන්
- **2016.12.31** දිනට ශේෂ පිරික්සුම
- **2016.12.31** දිනට ස්කන්ධය වෙනස්වීම් වාර්තාව

හෝමියෝපති වෛද්‍ය සභාව

**2016.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය**

| | | 2016 | 2015 |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | සටහන | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 2,334,346 | 2,218,074 |
| ජංගම නොවන වත්කම් | | | |
| පිරියත හා උපකරණ | 2 | 1,003,317 | 1,140,133 |
| ගොඩනැගිලි පුනරුත්තාපන | | 2,812,738 | 953,828 |
| වෙනත් උපකරණ | | 1,450.00 | 1,450 |
| | | **3,817,505** | **2,095,411** |
| මුළු වත්කම් | | **6,151,851** | **4,313,485** |
| බැරකම් | | | |
| ජංගම බැරකම් | | | |
| ගෙවිය යුතු දෑ | 3 | 594,126 | 192,156 |
| ජංගම නොවන බැරකම් | | | |
| මුළු බැරකම් | | 594,126 | 192,156 |
| ශුද්ධ වත්කම් | | 5,557,725 | 4,121,329 |
| | | **6,151,851** | **4,313,485** |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | | |
| ප්‍රාග්ධනය | | 2,562,144 | 2,562,144 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | | 3,430,957 | 1,572,047 |
| සමුච්චිත ඌනතාවය/අතිරික්තය | | (462,836) | (40,321) |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | | 27,460 | 27,459 |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | 5,557,725 | 4,121,329 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව ~~පාලක කමිටුව~~ විසින් දරණ බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ................ | ................ | ................ | ................ |
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සාමාජික | සකස් කළේ, |
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ප්‍රධාන ගණකාධිකාරී |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | දේශීය වෛද්‍ය අංශය |

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව

[illegible]
ප්‍රධාන ගණකාධිකාරී
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ඩබ්. ඒ. සී. එස්. ප්‍රියදර්ශනී
ප්‍රධාන ගණකාධිකාරී
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

| සටහන 1. | 2016 | 2015 |
|---|---|---|
| මුදල් හා මුදල් සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,626,281 | 1,553,109 |
| ලංකා බැංකුව | 512,165 | 469,065 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900 | 195,900 |
| | **2,334,346** | **2,218,074** |
| **සටහන 2.** | | |
| පිරියත හා උපකරණ | | |
| පිරියත හා උපකරණ (ගත්මිල) | 2,323,316 | 2,323,316 |
| අඩුකළා: | | |
| සමුච්චිත ක්ෂය | 1,319,999 | 1,183,183 |
| ශුද්ධ අගය | **1,003,317** | **1,140,133** |
| **සටහන 3.** | | |
| ගෙවිය යුතු දෑ | | |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් | | |
| ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් | | |
| ගෙවිය යුතු බෙහෙත් ශාලා ගාස්තු | 28,450 | 17,340 |
| ගෙවිය යුතු වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | | |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 185,616 | 145,616 |
| ගෙවිය යුතු දුරකතන ගාස්තු | 647 | 5,964 |
| ගෙවිය යුතු විදුලිය | 1,737 | 716 |
| ගෙවිය යුතු ගමන් වියදම් | | 1,567 |
| ගෙවිය යුතු ජල ගාස්තු | 792 | 1,800 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | 3,766 |
| ගෙවිය යුතු කාර්යාල උපකරණ අළුත් වැඩියා | | |
| ගෙවිය යුතු සංග්‍රහ වියදම් | | |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | | 14,487 |
| ගෙවිය යුතු ලිපිද්‍රව්‍ය වියදම් | | 900 |
| ගෙවිය යුතු හෝමියෝපති විභාගය සඳහා වූ වැය | | |
| ගෙවිය යුතු පාරිතෝෂික | 376,884 | |
| | 594,126 | 192,156 |

**සටහන 4**

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009)
අංක -1 ට අනුවය.

**සටහන 5**

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.

ක්ෂය අනුපාතය 12%කි.

වත්කම්, වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද, එය අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබේ.

වත්කම්, වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද, අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ.

## හෝමියෝපති වෛද්‍ය සභාව

## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන | 2016 | 2015 |
|---|---|---|---|
| **අයභාරය** | | | |
| රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන | | 12,596,733 | 12,026,123 |
| වෙනත් අයභාර | 1 | 43,100 | 23,500 |
| බැංකු පොලී | | 79,534 | 75,751 |
| මුළු අයභාරය | | **12,719,367** | **12,125,374** |
| **වියදම** | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 2 | 10,301,697 | 9,565,203 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | 3 | 18,845 | 57,770 |
| ක්ෂය හා ක්‍රම ක්ෂය | | 136,816 | 155,473 |
| වෙනත් වියදම් | 4 | 2,678,161 | 2,069,270 |
| නීති ගාස්තු | | | - |
| මූල්‍ය පිරිවැය (බැංකු ගාස්තු) | | 6,363 | 6,060 |
| මුළු වියදම | | **13,141,882** | **11,853,776** |
| කාලච්ඡේදය සඳහා ඌනතාවය /අතිරික්තය | | **(422,515)** | **271,598** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව ~~කමිටුව~~ විසින් දරණ බව සහතික කරමු.

........................
ලේඛකාධිකාරී
හෝමියෝපති
වෛද්‍ය සභාව

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

........................
සභාපති
හෝමියෝපති
වෛද්‍ය සභාව

සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව

........................
කමිටු සාමාජික
හෝමියෝපති
වෛද්‍ය සභාව

බී. ජී. විමලසේන
ප්‍රධාන ගණකාධිකාරී
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

........................
සකස් කළේ,
ප්‍රධාන ගණකාධිකාරී
දේශීය වෛද්‍ය අංශය

ඩබ්. ඒ. සී. එස්. ප්‍රියදර්ශනී
ප්‍රධාන ගණකාධිකාරී
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

| | 2016 | 2015 |
|---|---|---|
| සටහන 1 | | |
| වෙනත් අයභාර | | |
| වාර්ෂික ගාස්තු | 5,100 | 10,000 |
| විවිධ ලැබීම් | 38,000 | 13,500 |
| | **43,100** | **23,500** |
| සටහන 2 | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 8,961,708 | 8,306,477 |
| සේවක අර්ථ සාධක අරමුදල් | 1,071,991 | 974,181 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 267,998 | 243,545 |
| පුහුණු කාර්මික සිසුන්ට දීමනා | | 41,000 |
| | **10,301,697** | **9,565,203** |
| සටහන 3 | | |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 6,002 | 10,363 |
| සංග්‍රහ වියදම් | 12,843 | 47,407 |
| | **18,845** | **57,770** |
| සටහන 4 | | |
| වෙනත් වියදම් | | |
| විවිධ වියදම් | 21,679 | 46,952 |
| ගමන් වියදම් | 6,070 | 20,660 |
| බෙහෙත් ශාලා ගාස්තු | 333,450 | 144,000 |
| තැපැල් ගාස්තු | | 10,585 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 168,000 | 108,000 |
| විගණන ගාස්තු | 40,000 | 20,000 |
| ජල ගාස්තු | 52,397 | 29,388 |
| විදුලිය ගාස්තු | 21,290 | 15,403 |
| දුරකථන ගාස්තු | 47,358 | 63,219 |
| මුද්‍රණ ගාස්තු | 275,829 | 62,720 |
| දැන්වීම් ගාස්තු | | 80,919 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 10,047 | 11,183 |
| කාර්යාල උපකරණ හා වෙනත් උපකරණ | | 52,067 |
| භාෂා පරිවර්තන ගාස්තු | 17,587 | 17,806 |
| වෛද්‍ය සායන සඳහා උපකරණ(කුප්පි /කවර) | 1,290,440 | 1,145,241 |
| වෛද්‍ය සායන සඳහා වූ විවිධ වියදම් | 17,130 | 20,275 |
| ඉන්ධන වියදම් | | 15,897 |
| ශිෂ්‍යත්ව වියදම් | | 198,890 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | | 6,065 |
| පාරිතෝෂික වියදම් | 376,884 | |
| | **2,678,161** | **2,069,270** |

**සටහන 5**

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009)

අංක -1 ට අනුවය. එසේම එහි "ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහා පෑම" යන පරිදි ඉදිරිපත් කර ඇත.

**සටහන 6**

2012 සහ 2013 වර්ෂයන්ට අදාලව ගෙවන ලද විගණන ගාස්තු, විගණන ගාස්තු සඳහා වෙන් කිරීමේ ගිණුමට ගලපා ඇති අතර, මේ වර්ෂයට අදාලව විගණන ගාස්තු සඳහා වෙන් කර ඇත.

**සටහන 7**

හෝමියෝපති වෛද්‍ය සභාවේ සේවයේ නියුතු ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා , 2016 දෙසැම්බර් මස ගෙවන ලද වැටුප පාදක කරගෙන පාරිතෝෂික සඳහා වෙන් කර ඇත.

## හෝමියෝපති වෛද්‍ය සභාව
## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2016 | 2015 |
|---|---|---|---|
| මෙහේයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| ලැබීම් | | | |
| රජයෙන් ලද පුනරාවර්තන ප්‍රදානය | | 12,663,330 | 12,026,123 |
| බැංකු පොලී | | 79,534 | 75,751 |
| වෙනත් ලැබීම් | 1 | 43,100 | 23,500 |
| | | **12,785,964** | **12,125,374** |
| ගෙවීම් | | | |
| සේවක පිරිවැය | 2 | 10,277,013 | 9,572,761 |
| බැංකු පොලී (බැංකු ගාස්තු) | | 6,363 | 6,060 |
| වෙනත් ගෙවීම් | 3 | 2,386,317 | 2,453,362 |
| | | **12,669,693** | **12,032,183** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | **116,271** | **93,191** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 1,858,910 | - |
| ගොඩනැගිලි පුනරුත්ථාපන | | 1,858,910 | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | 4 | 116,271 | 93,191 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදීවූ මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | 2,218,075 | 2,124,884 |
| කාලපරිච්ඡේදය අවසානයේදීවූ මුදල් හා මුදල් හා සමාන දෑ | 6 | 2,334,346 | 2,218,075 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව ~~කමිටුව~~ විසින් දරණ බව සහතික කරමු.

| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සාමාජික | ~~සකස් කළේ,~~ |
|---|---|---|---|
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ප්‍රධාන ගණකාධිකාරී |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | දේශීය වෛද්‍ය අංශය |

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව

බී. පී. විමලසේන
ප්‍රධාන ගණකාධිකාරී
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ඩබ්. ඒ. සී. එස්. ප්‍රියදර්ශනී
ප්‍රධාන ගණකාධිකාරී
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

| | 2016 | 2015 |
|---|---|---|
| **සටහන 1 - අනෙකුත් ලැබීම්** | | |
| විවිධ ආදායම් | 5,100 | 13,500 |
| වාර්ෂික ගාස්තු | 38,000 | 10,000 |
| හෝමියෝපති විභාගය සඳහා වූ ගාස්තු | | - |
| | **43,100** | **23,500** |
| **සටහන 2 - සේවක පිරිවැය** | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 8,937,024 | 8,314,035 |
| සේවක අර්ථ සාධක අරමුදල් | 1,071,991 | 974,181 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 267,998 | 243,545 |
| පුහුණු කාර්මික සිසුන්ට දීමනා | | 41,000 |
| | **10,277,013** | **9,572,761** |
| **සටහන 3 - අනෙකුත් ගෙවීම්** | | |
| විවිධ වියදම් | 21,679 | 46,952 |
| ලිපිද්‍රව්‍ය | 6,902 | 10,243 |
| ගමන් වියදම් | 7,637 | 23,093 |
| බෙහෙත් ශාලා ගාස්තු | | 160,200 |
| තැපැල් ගාස්තු | | 10,585 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 168,000 | 124,000 |
| සංග්‍රහ වියදම් | 12,843 | 48,203 |
| ජල ගාස්තු | 53,405 | 29,195 |
| විදුලිය ගාස්තු | 20,269 | 15,312 |
| දුරකථන ගාස්තු | 52,675 | 64,500 |
| මුද්‍රණ ගාස්තු | 275,829 | 62,720 |
| දැන්වීම් ගාස්තු | | 80,919 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 10,047 | 11,182 |
| දැයට කිරුළ වියදම් | | |
| භාෂා පරිවර්තන ගාස්තු | 32,074 | 25,532 |
| නීති වියදම් | | |
| හෝමියෝපති විභාගය සඳහා වූ වැය | | |
| වෛද්‍ය සායන සඳහා උපකරණ | 1315910 | 1,145,241 |
| කාර්යාල උපකරණ හා වෙනත් උපකරණ | | 52,067 |
| වෛද්‍ය සායන සඳහා වූ විවිධ වියදම් | 342,450 | 11,936 |
| හෝමියෝපති විභාගය සඳහා වූ වැය | | 310,630 |
| ඉන්ධන වියදම් | | 15,897 |
| ශිෂ්‍යත්ව වියදම් | | 198,890 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | | 6,065 |
| විගණන ගාස්තු | 66,597 | |
| | **2,386,317** | **2,453,362** |

| | | |
|---|---|---|
| **සටහන 4 - මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම** | | |
| වර්ෂය අවසාන මුදල් ශේෂය | 2,334,346 | 2,022,175 |
| වර්ෂය ආරම්භක මුදල් ශේෂය | 2,218,075 | 1,928,984 |
| | **116,271** | **93,191** |
| **සටහන 5 - කාලපරිච්ඡේදය ආරම්භයේවූ මුදල් හා** | | |
| මුදල් හා සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,553,110 | 1,483,419 |
| ලංකා බැංකුව | 469,065 | 445,565 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900 | 195,900 |
| | **2,218,075** | **2,124,884** |
| **සටහන 6 - කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා** | | |
| මුදල් හා සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,626,281 | 1,553,110 |
| ලංකා බැංකුව | 512,165 | 469,065 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900 | 195,900 |
| | **2,334,346** | **2,218,075** |
| | **116,271** | **93,191** |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත/ (ඌනතාවය) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමඟ සැසඳීම | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත/ (ඌනතාවය) | (422,515) | 271,598 |
| මුදල් නොවන වෙනස් වීම් | | |
| ක්ෂය වීම් | 136,816 | 155,473 |
| ගෙවිය යුතු වැය වැඩිවීම/අඩුවීම | 401,970 | (333,880) |
| පෙර වර්ෂ ගැලපුම් ගිණුමේ වාර්ෂික වෙනස් වීම් | | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **116,271** | **93,191** |

**හෝමියෝපති වෛද්‍ය සභාව**

| | 2016.12.31 දිනට ශේෂ පිරික්සුම | |
|---|---|---|
| විස්තරය | හර රු. | බැර රු. |
| තැපැල් ගාස්තු | | |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | | |
| මුද්‍රණ ගාස්තු | 275,829.00 | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 8,961,708.00 | |
| උපචිත කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | |
| සේවක අර්ථ සාධක අරමුදල | 1,071,991.00 | |
| උපචිත සේවක අර්ථ සාධක අරමුදල | | |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 267,998.00 | |
| උපචිත සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | | |
| දුරකතන ගාස්තු | 47,358.00 | |
| උපචිත දුරකතන ගාස්තු | | 647.00 |
| විවිධ වියදම් | 21,679.00 | |
| ගමන් වියදම් | 6,070.00 | |
| උපචිත ගමන් වියදම් | | |
| කාර්යාල උපකරණ | 1,450.00 | |
| සායන සඳහා වූ අනෙකුත් වැය | 333,450.00 | |
| උපචිත සායන සඳහා වූ අනෙකුත් වැය | | 28,450.00 |
| සායන සඳහා උපකරණ | | |
| කාර්යාල උපකරණ අලුත්වැඩියා | 10,047.00 | |
| ජල ගාස්තු | 52,397.00 | |
| උපචිත ජල ගාස්තු | | 792.00 |
| විදුලි ගාස්තු | 21,290.00 | - |
| උපචිත විදුලි ගාස්තු | | 1,737.00 |
| ඉන්ධන වියදම් | | |
| විගණන ගාස්තු | | |
| විගණන ගාස්තු | 40,000.00 | |
| විගණන ගාස්තු වෙන්කිරීම | | 119,019.00 |
| බැංකු ගාස්තු | 6,363.00 | |
| රජයේ ප්‍රතිපාදන - පුනරාවර්තන | | 12,663,330.00 |
| රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධන | | 3,430,957.00 |
| බෙහෙත් ශාලා ගාස්තු | 1,307,570.00 | |
| උපචිත බෙහෙත් ශාලා ගාස්තු | | |
| වාර්ෂික ක්ෂය කිරීම් | 136,816.00 | |
| ක්ෂය වෙනිකිරීමේ ගිණුම | | 1,319,999.00 |
| වෙන්කල අරමුදල් ගිණුම | | |

| | | |
|---|---|---|
| වාර්ෂික ගාස්තු | | 5,100.00 |
| බැංකු පොලී ආදායම් ගාස්තු | | 79,534.00 |
| විවිධ ආදායම් | | 38,000.00 |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | | 27,460.00 |
| මුදල් ශේෂය - කොමර්ෂල් බැංකුව | 1,626,281.00 | |
| මුදල් ශේෂය - ලංකා බැංකුව | 512,165.00 | |
| මුදල් ශේෂය - ලංකා බැංකුව රාජගිරිය | 195,900.00 | |
| සුළු මුදල් | | |
| සංග්‍රහ වියදම් | 12,843.00 | |
| උපචිත සංග්‍රහ වියදම් | | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 6,002.00 | |
| උපචිත ලිපිද්‍රව්‍ය වියදම් | | |
| වෛද්‍ය සහා රැස්වීම් ගාස්තු | 168,000.00 | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | | |
| දැන්වීම් ගාස්තු | | |
| හෝමියෝපති විභාග ගාස්තු | | |
| උපචිත හෝමියෝපති විභාග ගාස්තු | | |
| භාෂා පරිවර්තන ගාස්තු | 17,587.00 | |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | | |
| ශිෂ්‍යත්ව වියදම් | | |
| උපචිත භාෂා පරිවර්තන ගාස්තු | | |
| උපචිත කාර්යාල උපකරණ අලුත්වැඩියා | | |
| පාරිතෝෂික වියදම් | 376,884.00 | |
| උපචිත පාරිතෝෂික | | 376,884.00 |
| නීති ගාස්තු | | |
| දැයට කිරුල වැය | | |
| දේපල පිරියත හා උපකරණ | 2,323,316.00 | |
| ගොඩනැගිලි පුනරුත්ථාපන වැය | 2,812,738.00 | |
| ප්‍රාග්ධන ගිණුම | | 2,562,144.00 |
| 2015.12.31 දිනට සමුච්චිත ඌනතා ගිණුමේ ශේෂය | 40,321.00 | |
| එකතුව | 20,654,053.00 | 20,654,053.00 |

**හෝමියෝපති වෛද්‍ය සභාව**

| ස්කන්ධය වෙනස්වීම් | සංචිත<br>රු. |
|---|---:|
| ආරම්භක ශේෂය (2016.01.01 දිනට) | 2,562,144.00 |
| | |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | 3,430,957.00 |
| | |
| පෙර වර්ෂ ගැලපුම් | 27,460.00 |
| | |
| සමුච්චිත ඌනතාවය / අතිරික්තය | (462,836.00) |
| | |
| වර්ෂය අවසානයේ ශේෂය (2016.12.31 දිනට) | 5,557,725.00 |
| | |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/බී/එච්එම්සී/ 1/16/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ඔක්තෝබර් 31 දින

සභාපති,

හෝමියෝපති වෛද්‍ය සභාව.

**හෝමියෝපති වෛද්‍ය සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI - 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 21 (ඊ) ප්‍රකාරව සභාවේ පාරිතෝෂික වෙන්කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08

සභාවට එරෙහිව පවතින නඩු 5 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී ඖෂධ බහාලුම් මිලදී ගැනීම් පාරිභෝජන තොගයට හර කිරීම වෙනුවට සම්පූර්ණ වියදමක් ලෙස සළකා ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් රු.504,000 ක් සහ 2016 දෙසැම්බර් 31

දිනට පාරිභෝජන තොග වටිනාකම රු.633,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සේවකයින් 19 දෙනෙකුට අදාළ පාරිතෝෂික ප්‍රතිපාදනය රු.597,104 ක් වුවත් ඒ වෙනුවට රු.376,884 ක ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික ප්‍රතිපාදන රු.220,220 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) විභාග ගාස්තු වශයෙන් 2014 වර්ෂයේදී සභාවේ ජංගම ගිණුමට බැරවිය යුතු රු.195,900 ක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජංගම ගිණුමකට බැර කර තිබුණි. ඒ අනුව, එම ආදායම රජයේ ආදායමට බැරවී තිබූ බැවින් තවදුරටත් කපාහැරීමට කටයුතු කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ගොඩනැගිලිවල වටිනාකම රු.2,812,738 ක් සඳහා වාර්ෂික ක්ෂය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු ශේෂ පිරික්සුමට අනුව රජයේ පුනරාවර්තන ප්‍රතිපාදනය රු.12,663,330 ක් වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව එම වටිනාකම රු.12,596,733 ක් වූයෙන් රු.66,597 ක වෙනසක් විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

2016 ජනවාරි 01 දිනට ගෙවිය යුතු වියදම් විෂයයන් 8 ක ශේෂ එකතුව රු.192,156 ක් වූ අතර ඉන් වියදම් විෂයයන් 6 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.594,126 ක් විය. වර්ෂයට අදාළ වියදම, ඉදිරියට ගෙවූ හා ගෙවිය යුතු වියදම්වල නිවැරදිතාවය තහවුරු කරගැනීමට හැකිවන පරිදි පොදු ලෙජරයේ අදාළ ලෙජර් ගිණුම් පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.422,515 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.271,598 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.694,113 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම් රු.1,288,106 කින් වැඩිවී තිබුණද රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන වැඩිවීම රු.570,610 ක් පමණක් වීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012, වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩ ඌනතාවයක් ඇති වී තිබුණු අතර 2012 වර්ෂයේදී රු.29,305 ක් වූ එය 2014 වර්ෂය වනවිට රු.170,636 ක් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් 2015 වර්ෂයේදී රු.271,598 ක අතිරික්තයක් වී තිබුණ ද නැවතත් 2016 වර්ෂයේදී රු.422,515 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.4,517,886 ක්වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.9,951,274 දක්වා සියයට 6 ත් සියයට 93 ත් අතර උච්චාවචනයන් සහිතව වර්ධනය වී තිබුණි. එහෙත්, 2016 වර්ෂයේදී දායකත්වය රු.10,015,998 දක්වා වර්ධනය වී තිබුණද එහි වර්ධනය 2015 වර්ෂයට සාපේක්ෂව සියයට එකක් පමණක් විය.

### 3.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

වෛද්‍ය සභාවේ සේවය කළ වෛද්‍යවරයෙකු හා කම්කරුවෙකු සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව පිළිවෙලින් රු.මිලියන 3 ක් හා රු.මිලියන 2 ක් බැගින් වන්දි ඉල්ලා නඩු පවරා තිබුණි. ඊට අමතරව, හිඟ වැටුප් ගෙවීම හා වෛද්‍ය සභාව විසුරුවා හැරීමෙන් පසු සිදුකළ පත්කිරීම් හා ලියාපදිංචි කිරීම් බලරහිත කරන ලෙස ඉල්ලා වෛද්‍යවරු දෙදෙනෙකු විසින් සභාවට එරෙහිව නඩු 2 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1970 අංක 7 දරන හෝමියෝපති පනත ප්‍රකාරව,

- හෝමියෝපති ක්‍රමයට අනුව වෛද්‍ය කර්මයෙහි යෙදීම ක්‍රමවත් කිරීම, පාලනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ධෛර්යමත් කිරීම.

- හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හැදෑරීම සහ ඒ පිළිබඳ පර්යේෂණ කිරීම ධෛර්යමත් කිරීම, හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම හා එය නඩත්තු කරගෙන යාම.

- හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව රෝග පිළිබඳ අන්වේශණයට සහ මහජන සෞඛ්‍ය වර්ධනයට පියවර ගැනීම සංවර්ධනය කිරීම හෝ එය ධෛර්යමත් කිරීම.

- හෝමියෝපති ආයතන ක්‍රමවත් කිරීම හා පාලනය කිරීම සහ හෝමියෝපති ඖෂධ වර්ග, බෙහෙත් සහ වෙනත් ඖෂධ සංයෝග නිෂ්පාදනය, ආනයනය, විකිණීම් සහ බෙදාහැරීම ක්‍රමවත් කිරීම හා පාලනය කිරීම සභාවේ අරමුණු ලෙස දක්වා තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළදී ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) හෝමියෝපති ක්‍රමවේදයට අනුව වෛද්‍ය කර්මයෙහි යෙදීම ක්‍රමවත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ධෛර්යමත් කිරීම, හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හැදෑරීම සහ ඒ පිළිබඳ පර්යේෂණ කිරීම ධෛර්යමත් කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

(i) ජංගම සායන 21 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද, ඉන් සායන 11 ක්ම පවත්වා නොතිබුණි.

(ii) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දැනුවත් කිරීමේ පාසැල් වැඩසටහන් 03 ක් පැවැත්වීම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ සියලුම ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ 2 ක් පැවැත්වීම හා Web Home Page එකක් ආරම්භ කිරීම යන සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) හෝමියෝපති වෛද්‍යවරුන්ගේ සේවය සහ අත්දැකීම් ඇගයීමේ වැඩමුළු 02 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද එම වැඩමුළු පවත්වා නොතිබුණි.

(iv) හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා පිළිගත් නිශ්චිත පරිපාලන පරිපාටියක් හඳුන්වාදීම, රෙගුලාසි සම්පාදනය කිරීම හා ගැසට් කිරීම, හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය පිළිබඳ වෙළඳපොල සුලභතාවය තහවුරු කිරීම සඳහා අතුරු නීති සම්පාදනය කිරීම, හෝමියෝපති බෙහෙත් ගබඩා සහ ඔසුසල් පිහිටුවීම සඳහා අරමුදල් ගොඩනැගීම හා ඖෂධ තොග ආනයනය සහ බෙදාහැරීමට සැලසුම්කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒ සම්බන්ධයෙන් වූ කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලීබඩු හා උපකරණ සපයාගෙන තිබුණද, එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් 2017 සැප්තැම්බර් 19 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භකර නොතිබුණි. ඒ අනුව, මිලදී ගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වර්ෂ 06 ට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2012 ජනවාරි 05 දින පැවති අතුරු පාලක කමිටු රැස්වීමේදී දැනට පවතින වෛද්‍ය සායන 7 සඳහා පොදු නියෝග මාලාවක් සැකසීමටද, 2013 අගෝස්තු 29 දින පැවති අතුරු පාලක කමිටු රැස්වීමේදී නව සායන 14 ක් සඳහා තනතුරු අනුමත කරවා ගැනීමට හා හෝමියෝපති අධ්‍යාපන ආයතනය පිළිබඳ රීතින් හා අවශ්‍යතා ගැසට් කිරීමටද, 2014 ජනවාරි 08 දින පැවති අතුරු පාලක කමිටු රැස්වීමේදී හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම පිළිබඳව 1981 හෝමියෝපති නියෝග තවදුරටත් පුළුල් කරමින් ප්‍රමාණවත් පරිදි නීති හා රෙගුලාසි සකස් කිරීමටද තීරණය කර තිබුණු නමුත් විගණිත දිනය වූ 2017 සැප්තැම්බර් 19 දින වන විටත් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 හඳුනාගන්නා ලද පාඩු

-----------------------------

අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගැනීමකින් තොරව මිලදී ගැනීම 2016 දෙසැම්බර් 31 දිනට කුඩා ප්‍රමාණයේ ඖෂධ බහාලුම් (ඩප්පි) ඒකක 170,000 ක් හා මධ්‍යම ප්‍රමාණයේ ඩප්පි ඒකක 172,000 ක් ඉතිරිව තිබුණි. සභා ගොඩනැගිලි පරිශ්‍රය තුළ ප්‍රමාණවත් හා ප්‍රමිතියෙන් යුත් ගබඩා පහසුකම් නොතිබුණු බැවින් ඖෂධ බහාලුම් (ඩප්පි) ආරක්ෂා සහිතව හා විෂබීජවලින් තොරව ගබඩාකර නොතිබුණු අතර ආවරණ පලුදු වී හා අපවිත්‍ර වී තිබුණි. මේ හේතුවෙන්, දළ වශයෙන් රු.92,750 ක් වටිනාකම වූ ඖෂධ බහාලුම් (ඩප්පි) 50,500 කට ආසන්න ප්‍රමාණයක් භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණු බව 2017 සැප්තැම්බර් 19 දින සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පීඊඞී 12 හි 5.2 වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ආදායම් හා වියදම් සම්බන්ධ ඇස්තමේන්තුගත අයවැය ලේඛනයක් පිළියෙල කර එය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

වර්තමාන තත්වයට ගැලපෙන පරිදි සභාවේ රෙගුලාසි යාවත්කාලීන කළ යුතු බවට 2010 සැප්තැම්බර් 15 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝගකර තිබුණි. 2016 අංක 10 දරන නව හෝමියෝපති පනත 2016 ජූලි මස 29 දින සිට බලාත්මක කර තිබුණු අතර, නව වෛද්‍ය සභාව 2016 ඔක්තෝබර් මාසයේදී පත්කර තිබුණු නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.4 පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. මූලික උපයෝගී පොත්, පොදු ලෙජරය හා ජර්නල් සටහන් සහිතව ගිණුම් කටයුතු පවත්වා ගෙන යාම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති